Department of Education Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය - 4

ශ්‍රේණිය - 12

සකස් කළේ - කලාප අධ්‍යාපන කාර්යාලය ,රත්නපුර

නිපුණතාව 1.0 - ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්න හා ඒවා විසඳා ගන්නා විකල්ප ක්‍රම තුලනාත්මකව විග්‍රහ කරයි.

නිපුණතා මට්ටම 1.4 - ආර්ථිකයක කේන්ද්‍රීය ගැටළුව තාර්කිකව විශ්ලේෂණය කරයි.

- **<u>හිඟකම -</u>**

  මිනිස් වුවමනා සමඟ සාපේක්ෂව සලකා බලන සම්පත් ප්‍රමාණවත් නොවීමයි.

- හිඟකම ගැටළුව පැන නඟිනුයේ සමාජයේ පවත්නා ප්‍රධාන ලක්ෂණ දෙකක් නිසාය.එනම්,

  1.යම් දෙන ලද අවස්ථාවක මිනිසුන්ගේ වුවමනා අසීමිත වීම.
  2.යම් දෙන ලද අවස්ථාවක එම වුවමනා සපුරා ගැනීමට අවශ්‍ය කරන භාණ්ඩ හා සේවා නිශ්පාදනය සඳහා යොදා ගත හැකි සම්පත් ප්‍රමාණය සීමා වීමයි.

**<u>ඇගයීම</u>**

1.හිඟකම ආර්ථික විද්‍යාවේ කේන්ද්‍රීය ගැටළුව ලෙස සැලකෙන්නේ ඇයි?

2.ආර්ථික පද්ධතියක් තුළ තේරීමේ ප්‍රශ්නය හට ගන්නේ ඇයි?

3.ආවස්ථික පිරිවැය යනු කුමක්ද?

4.ආවස්ථික පිරිවැය ශුන්‍ය අගයක් ගන්නා අවස්ථා තුනක් නම් කරන්න.